www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඛනිජ තෙල් කම්කරුවන්ගේ වර්ජනය බිඳීමට ආන්ඩුව හමුදාව මෙහයවයි

Sri Lankan government deploys army to break oil workers' strike

ශ්‍රී හරන් සහ ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි

**2017 ජුලි 27**

රජයට අයත් කොලොන්නාව, මුතුරාජවෙල හා පේරාදෙනිය ඇතුලු ලංකා ඛනිජතෙල් සංස්ථාවේ ප්‍රධාන සැපයුම් මධ්‍යස්ථාන අත්පත් කර ගැනීම සඳහා ආන්ඩුව අඟහරුවාදා රාත්‍රියෙහි හමුදාව මෙහෙයවීය.

ආර්ථිකයේ මුලික අංශ වල වර්ජන තහනම් කිරීමට ආන්ඩුවට ඉඩසලසන රැදුරු අත්‍යාවශ්‍ය සේවා නීතිය යටතේ කෙරුන මෙම හමුදා මෙහෙයුමේ අරමුන වූයේ ඛනිජතෙල් කම්කරුවන්ගේ අඛන්ඩ වැඩ වර්ජනය බිඳීමය.

පෙට්‍රල්, ඩීසල් සහ ගෑස් සැපයුම හා බෙදා හැරීම රටපුරාම ඇනහිටවමින් සඳුදා මධ්‍යම රාත්‍රියේ වර්ජනය ආරම්භ විය. වර්ජනය පලල් සමාජ විරුද්ධත්වයේ නාභියක් බවට පත්වෙතැයි බියවූ ආන්ඩුව වහාම එය මර්දනය කිරීමට පියවර ගත්තේය.

වර්ජනය කැඳවුම් කලේ මෛත්‍රිපාල සිරිසේනගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් පාලනය කරන ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ (ශ්‍රීලංනිසේසං) තෙල් සංස්ථා ශාඛාව හා විරුද්ධ පක්ෂයේ ජනතා විමුක්ති පෙරමුනට සම්බන්ධ ඛනිජතෙල් පොදු සේවක සංගමය ඇතුලු ඛනිජ තෙල් සංස්ථා වෘත්තීය සමිති එකමුතුව විසිනි. පාලක එක්සත් ජාතික පක්ෂයේ (එජාප) ජාතික සේවක සංගමය වර්ජනයට සම්බන්ධ නොවීය.

වෘත්තීය සමිති වර්ජනය කැඳවුම් කලේ ත්‍රිකුනාමලේ තෙල් සංකීර්නය ඉන්දියාවට පැවරීම නතර කිරීම, චීනයට දීමට සුදානම් කර ඇති හම්බන්තොට ටැංකි රජයට පවරා ගැනීම සහ සපුගස් කන්ද තෙල් පිරිපහදුවේ ප්‍රතිසංස්කරන කටයුතු කඩිනම් කරන ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටීමටය.

පුද්ගලීකරනයට සිය විරුද්ධත්වය ප්‍රකාශ කිරීම පිනිස කම්කරුවෝ වර්ජනයට සම්බන්ධ වූහ. එහෙත් වෘත්තීය සමිති ඉල්ලීම් වල අරමුන වූයේ චීනය සහ ඉන්දියාව ජාතිකවාදී හෙලා දැකීමක් තුලින් ඔවුන්ගේ විරුද්ධත්වය අපසරනය කිරීමෙන් කම්කරු පන්තිය බෙදීම හා ඛනිජ තෙල් සංස්ථාවේ අයිතිය රජය අතේ තිබුනොත් කම්කරුවන්ගේ අයිතීන් සහ සේවා කොන්දේසි ආරක්ෂා වන බවට ප්‍රෝඩාවක් වගාදිගා කිරීමය.

වර්ජනය තහනම් කරමින් ජනාධිපති සිරිසේන අතිවිශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කලේය. ආන්ඩුවේ වර්ජන විරෝධී රුදුරු නීතිය ප්‍රකාශයට පත් කිරීමෙන් පැය 24 ක් ඇතුලත සේවයට වාර්තා නොකරන සේවකයන් සේවය අතහැර ගියා සේ සලකන අතර ඔවුන් රැකියාවෙන් නෙරපන බවට ඉන් තර්ජනය කෙරුනි.

මෙය, කම්කරුවන්ගේ අරගල වලට විරුද්ධව හමුදා මෙහෙයුම් පෙලක මෑතම එකය. උදාහරන ලෙස, සිය රැකියා ස්ථිර කරන ලෙස ඉල්ලමින් පසුගිය දෙසැම්බර් මාසයේ විරෝධතා උද්ඝෝෂනයක යෙදුන හම්බන්තොට වරායේ කොන්ත්‍රාත් කම්කරුවන්ගේ අරගලය කඩාකප්පල් කිරීමට ආන්ඩුව සියගනනක් නාවික හටයන් යෙදවීය.

අඟහරුවාදා රාත්‍රියෙහි ප්‍රධාන තෙල් බෙදාහැරීමේ මධ්‍යස්ථාන වලට ඇතුලු වීමට පොලීසිය අසමත් වූ විට අධික ලෙස සන්නද්ධව පිටුපස ගේට්ටුවෙන් කොලොන්නාව තෙල් බෙදා හැරීමේ මධ්‍යස්ථානට ඇතුලු වූ පොලිස් විශේෂ කාර්ය බලකාය (එස්ටීඑෆ්) විසින් ඇතුලත සිටි සිය ගනනක් සේවකයන් බලහත්කාරයෙන් එලියට ඇද දමන ලදී.

ඔවුන් සංස්ථා පරිශ්‍රයෙන් එලවා දැමීමට පෙර අසභ්‍ය වචනයෙන් බැන හමුදාව තමන්ට පහර දුන් බව සේවකයෝ ලෝක සමාජවාදී වෙබ් අඩවියට ප්‍රකාශ කලහ. සමහරු ඔසවා තාප්පෙන් එලියට විසිකර ඇත. සෙසු අය ඇදගෙන විත් එලියට දමා ඇත.

හමුදාව හැසුරුනේ යුද කලාපයක වගේ යැයි සේවකයෝ කීහ. අඟහරුවාදා සවස අරලිය ගහ මන්දිරයේ දී අගමැති රනිල් වික්‍රමසිංහ සමග පැවති සාකච්චාවකින් අනතුරුව හිටපු හමුදාපති හා වර්තමාන ආන්ඩුවේ ඇමතියෙක් වන ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා විසින් මෙම මෙහෙයුම සැලසුම් කල බවට තමන්ට තොරතුරු ලැබී ඇතැයි සමහරු කීහ.

2009 අවසන් වූ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහි වාර්ගික යුද්ධය අනුකම්පා විරහිත ලෙස මෙහෙයවීම සම්බන්ධයෙන් ෆොන්සේකා කුප්‍රකටය.

කම්කරුවන් එලියට දැමීමෙන් පසු අධිකව සන්නද්ධ වූ හමුදා සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ (එස්ටීඑෆ්) නිලධාරීන් සිය ගනනක් ප්‍රධාන ගේට්ටු ඉදිරිපිට සීරුවෙන් තැබීය.

බැටන් පොලු, කඳුලු ගෑස් සහ ජලවිදින ට්‍රක් රථවලින් සන්නද්ධ වූ කැරලි මර්දන පොලීසිය කොලොන්නාව සංස්ථාව ඉදිරිපිට සීරුවෙන් තබා සිටියහ. තෙල් ප්‍රවාහනය කල දුම්රිය සහ බවුසර් අවහිර කිරීමට සේවකයන් උත්සාහ කලත් එස්ටීඑෆ් හටයෝ ඔවුන්ට පහර දී එය වලකාලූහ. සමිති නායකයන් ඇතුලු

ක්‍රියාකාරීන් 16 දෙනෙකු අත්අඩංගුවට ගත් පොලීසිය ඔවුන් ඇදගෙන ගොස් නවතා තිබූ ට්‍රක් රථවලට දැමූහ. පොලීසිය හා මැරයෝ පහර දී සෙසු සේවකයන් විසුරුවා හැරියහ. අත් අඩංගුවට ගත් කම්කරුවන් පසුව පොලිස් ඇප මත මුදා හැරුනි.

හමුදා මෙහෙයුම සමස්ත කම්කරු පන්තිය ත්‍රස්ත කිරීමේ අරමුනින් කෙරුනක් බව සිරිසේන ඊයේ සවස පැවති ප්‍රසිද්ධ රැස්වීමක කල කතාවක දී පැහැදිලි විය. “”සුලු කන්ඩායම් වලට බහුතරයට හිංසා කිරීමට ආන්ඩුව ඉඩ නොදෙන” බවට එහි දී ඔහු අනතුරු ඇඟවිය.

“අප දැනටමත් තෙල් බෙදා හැරීම අත්‍යාවශ්‍ය සේවාවක් බවට පත් කරල තියෙනවා. අත්‍යාවශ්‍ය සේවා නියෝග පැනවීමෙන් පසු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල වලට අනුව එය ක්‍රියාවේ යෙදවීම සඳහා ගත යුතු හැම පියවරක් ම දෙගිඩියාවෙන් තොරව ගන්නවා” යයි සිරිසේන පැවසුවේය.

පසුගිය දිනවල වෛද්‍යවරුන්ගේ වර්ජන ගැන සඳහන් කරමින් වෛද්‍යවරු වර්ජන “සෙල්ලමක්” බවට පත් කරගෙන ඇතැයි ජනාධිපති කීවේ ය. හිටපු ජනාධිපතිගේ ආඥාදායක පාලනය යටතේ “අද කෑ ගහන අයගෙ සලකුනක්වත් සොයා ගැනීමට නොහැකි වූ” බව ඔහු තර්ජනාත්මකව මතක් කලේ ය. කිසිවෙකුට ආන්ඩුව පෙරලීමට ඉඩ නොදෙන බව ද සිරිසේන කීවේය.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියට* කතා කල කම්කරුවෝ වර්ජනය කඩාකප්පල් කිරීමේ සිරිසේනගේ ප්‍රහාරය ගැන දැඩිව විරුද්ධත්වය ප්‍රකාශ කලහ. එල්ටීටීඊයට විරුද්ධ එහි රුදුරු යුද්ධයේ දී ඛනිජ තෙල් සංස්ථා සේවකයන් ඔවුන්ගේ වැටුප සහ ලේ පවා පරිත්‍යාග කල බව එක සේවකයෙක් පැවසුවේය. “නමුත් දැන් ආරක්ෂක හමුදා යුද්ධයේ දී පාවිච්චි කල ක්‍රම ම යොදා ගනිමින් අපට පහර දෙන” බව ඔහු කීවේ ය.

ප්‍රතිගාමී යුද්ධයට සහයෝගය දීමෙන් හා “මාතෘභූමිය ආරක්ෂා කර ගැනීම සඳහා පරිත්‍යාග කරන” ලෙස කම්කරුවන්ට කැඳවුම් කිරීමෙන් ප්‍රධාන වෘත්තීය සමිති සහ ධනපති දේශපාලන පක්ෂ මෙම හමුදා ප්‍රහාරයන් ට මාවත පෑදූහ.

“මෙම අරගලයේ දී අපි සටන් කලේ පුද්ගලීකරනයට විරුද්ධව. අප්‍රේල් මාසේ තිබුන වර්ජනයේ දී වික්‍රමසිංහ පොරොන්දු වුනා ත්‍රිකුනාමලේ සහ හම්බන්තොට තෙල් ටැංකි ඉන්දියාවට සහ චීනයට දෙන්නේ නැහැ කියල. නමුත් ඔහු අපිව රැවට්ටුවා” කම්කරුවෝ කීහ.

පුද්ගලීකරනය නතර කරනු ඇතැයි සිතා ඛනිජ තෙල් සංස්ථා සේවකයන්ගෙන් බහුතරයක් සිරිසේන ආන්ඩුවට චන්දය දුන් බව තවත් කම්කරුවෙක් කීවේය. “නමුත් මේ ආන්ඩුවත් කලින් පැවති රාජපක්ෂ ආන්ඩුවෙන් වෙනස් නැති බව දැන් පෙන්නලා තියෙන” බව ඔහු පැවසුවේය.

ආන්ඩුවට කරන ආයාචනාවලින් රාජ්‍ය සම්පත් විකිනීම සීමා කිරීමට සහ කම්කරුවන්ගේ සේවා කොන්දේසි ආරක්ෂා කලහැකි බවට මිත්‍යාවන් වගාදිගා කල වෘත්තීය සමිතිවල බංකොලොත්කම ද සිදුවෙමින් පවතින පුද්ගලීකරනය තුල දී ඉස්මතු කෙරී ඇත. ශ්‍රී ලංකාවේ ධනපති ක්‍රමයේ ගැඹුරුවන අර්බුදය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පනවා ඇති ආර්ථික ප්‍රතිසංස්කරන යටතේ පුද්ගලීකරන ක්‍රියාවලිය සිදුවන බව වසන් කිරීමට ඔවුහු උත්සාහ කරති.

ලංකා ඛනිජ තෙල් සංස්ථාව ලාබදායක ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාම සඳහා වර්ජනයට පෙර ආන්ඩුවට යෝජනා මාලාවක් ඉදිරිපත් කල බව ශ්‍රීලංනිසේසං යේ ලේකම් ජයන්ත පරෙයිරා කීවේය. එම යෝජානාවලිය ගැන අගමැති සතුට ප්‍රකාශ කල බව ද ඔහු පැවසුවේ ය.

අගහරුවාදා වර්ජනය කැඳවන විට වෘත්තීය සමිති කීවේ ඔවුන් “රවටා” ඇති බව හා වර්ජනය අඛන්ඩව කෙරෙන බවකි. එහෙත් හමුදාව විසින් වර්ජනය මර්දනය කිරීමෙන් පසු බදාදා සිරිසේන හමුවූ ඔවුහු ආන්ඩුව හමුදාව ඉවත්කර ගන්නේ නම්, අත්‍යාවශ්‍ය සේවාවන් පටන් ගැනීමට සූදානම් බව ප්‍රකාශ කලහ. “විසඳුමක්” ඇතිකර ගැනීම සඳහා ආන්ඩුව සමග තව දුරටත් සාකච්චා කිරීමට පොරොන්දු වෙමින් වෘත්තීය සමිති නායකයෝ ප්‍රකාශයක් ද නිකුත් කලෝය.

පසුගිය අප්‍රේල් මාසයේ “අඛන්ඩ” වර්ජනයක් කැඳවුම් කල සමිති නායකයෝ අගමැති සමග සාකාච්චාවකින් පසු, එක් දිනකින් එය නතර කලහ.“රට විනයගත කිරීම” පිනිස ෆොන්සේකා වසර දෙකකට හමුදාව බාර ගත යුතුයැයි යෝජනා කරමින් සිරිසේන වර්ජනයට ප්‍රතිචාර දැක්වුයේ ය. [බලන්න “රට විනයගත කරන ලෙස” ජනාධිපති සිරිසේන ෆීල්ඩ් මාර්ෂල් ෆොන්සේකාගෙන් ඉල්ලයි]

වෙනත් වචනවලින් කිවහොත් කම්කරුන්ට එරෙහි ආන්ඩුවේ හමුදා ප්‍රහාරය ආඥාදායකත්වයක් දිසාවට කෙරන පුලුල් හැරීමක කොටසකි.

දොරගුලු දැමූ කාමර තුල ආන්ඩුව සමග වෘත්තීය සමිති නායකයන් දමන උපාමරු පෙන්නුම් කරන්නේ සමාජ හා ප්‍රජාතාන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කිරීමට සහ ආඥාදායක පාලනකයකට මාරුවීමට එරෙහිව සටන් කිරීම සඳහා වෘත්තීය සමිති වලට විරුද්ධව සාමාජිකයන්ගේ ක්‍රියාකාරී කමිටු ඇතුලු නව සංවිධාන කම්කරුවන්ට අවශ්‍ය බවය.

වරාය සහ තෙල් ඇතුලු සේවාවන් මහජන අයිතියට හා කම්කරුවන් ගේ පාලනයට යටත් කිරීම ඇතුලු සමාජවාදී පිලිවෙත් ක්‍රියාවට දමන කම්කරු ගොවි ආන්ඩුවක් තහවුරු කිරීම එල්ල කර ගත් නව දේශපාලන ඉදිරිදර්ශනයක් මත මෙම සංවිධාන පාදක කල යුතු ය.

© www.wsws.org